# රුහුණේ ඇදහිලි හා විශ්වාසය

පොළොන්නරුවේ = හේමසිරි

ලේඛනාරූඪ අංකය, වී. 282

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

1979/80 වර්ෂයේ

ශාස්ත්‍රපති (ඉතිහාසය)

උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධය

122793

# සාරාංශය

පළමුවන පරිච්ඡේදය මූලාශ්‍ර පැහැදිලිකිරීමකි. මෙහි මූලාශ්‍ර ඓතිහාසික සාහිත්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක වශයෙන් කොටස්කර ඇත. ඓතිහාසික වශයෙන් මහාවංශය රාජාවලිය හා පූජාවලිය යන ග්‍රන්ථද සාහිත්‍යාත්මක වශයෙන් සන්දේශග්‍රන්ථද වැඩිවශයෙන් ප්‍රයෝජනවත් විය. අමාවතුර රූපාවලී යනාදී සිංහල ග්‍රන්ථද පාලි සාහිත්‍යාත්මක ග්‍රන්ථද හඳුන්වා දී ඇත. පුරාවිද්‍යාත්මක වශයෙන් රුහුණේ ඇති බුදුරුවගල, හැඹරාගල වැනි මහායානික ප්‍රතිමාද සෙල්ලිපි හා මැටියෙන් කළ මුද්‍රාද පෙන්වාදුන් අතර සෙනරත් පරණවිතාන තුමාද මූලාශ්‍ර වශයෙන් සලකනලදී.

මේ පරිච්ඡේදයේ දෙවන කොටස රෝහණ දේශ සීමාවයි. ඈත අතීතයේ වය ලක්දිවින් තුනෙන් එකකටත් වැඩි ප්‍රදේශයක් වුවද කෙමෙන් කුඩාවීඇත. එසේ වූඅයුරු පෙන්වාදී මුළු දකුණු පලාතත් මොනරාගල දිස්ත්‍රික්කයත් ඇතුලත් සුළු ප්‍රදේශයකට සීමාවිගිය අයුරු දැක්වීන. මෙහිදී රුහුණේ ජනජීවිතය ගැන සුළු හැඳින්වීමක් කෙරින. මුද්‍රකරයේ ටීචරයන් අතරත් ගම්බද ගොවියා අතරද ඇති සාරම්පරික පොදු විශ්වාස ගැන සුළු විස්තරයකිනුත් එම පරිච්ඡේදය අවසන්කර ඇත.

දෙවන පරිච්ඡේදයේ ප්‍රධාන මාතෘකාව ලක්දිව මහායානයයි. ලක්දිව මහායානය වඩගාමිණී අභය කාලයෙහි ආරම්භවීයයි බොහෝ දෙනා සලකනත් එයට ශතවර්ෂ තිපයකට පෙර මෙරට සර්වාස්තිවාදීන් සිටිබවට ඉඟියක් දෙන සෙල්ලිපියක් දක්නට තිබේ. එසේම දුටුගැමුණු රජුගේ කාලයෙහි රුවන්වැලි උළෙල සඳහා නොයෙක් දේශයන්ගෙන් පැමිණි භික්ෂූන්වහන්සේගෙන්ද මෙහි පැවති ථෙරවාදයට සෑහෙන බලපෑමක් ඇතිවූ බව පෙන්වාදෙනලදී. භික්ෂු මාහිමියන්ගේ දෙවදූත සූත්‍රය හා විමානවත්‍ථු පෙතවත්‍ථු දේශනයද මේ රටේ පැවති පැරණි විශ්වාසයන්ට නතුවීමක් හැටියට නේවාදුනිමු. මළවුන් ඇදහීමද මෙහි පැවතිබවට ප්‍රමාණවත් සාධක දක්වාතිබේ. ඉල්මහ උළෙල ඉතා ඈත යුගයක සිට පැවති උත්සවයක් බව ජාතකකථාවෙන් ගෙනහැරපෑවෙමු.

මේ විශ්වාස පැතිරීමේ සමයෙහි අනුරාධපුරයෙහි මෙන්ම රුහුණෙහි පැවතිබවද විස්තරකරඇත. පැරණි බුදුසමය ආශ්‍රම ජීවිතයට නැඹුරුවූ එකක් වීම නිසා මහායාන වැනි නව ඉගැන්වීම් ලක පුරා පැතුරුණ ආකාරය ද කියාතිබේ. විශේෂයෙන්ම රුහුණේ උපාලවණ්ණ, සුමන, යම, සහ නාථ ආදීන් පිළිබඳ විශ්වාසයන් පැතිරයාමට හේතුද රුහුණේ ලැබ්ඇති පුරාවස්තූන්ද පෙන්වමින් මෙය සනාථ කරතිබේ. මේ පරිච්ඡේදය අවසානවී ඇත්තේ මහායානයේ එන ප්‍රධානම පිළිගැනීමවූ බෝධිසත්ව සංකල්පය ගැන කළ විස්තරයකිනි. ඒ සමග සමින්කළ මන්ත්‍රයානය ගැනද ඉතා කෙටියෙන් කරුණු තිබේ.

තුන්වන පරිච්ඡේදය රුහුණෙ ප්‍රධාන දෙවිවරුන් වෙනුවෙන් වෙන්වී තිබේ. ප්‍රධාන දෙවිවරුන් වශයෙන් සුමන, උපුල්වන්, කතරගම, නාථ හා විෂ්ණු පෙන්වාදෙනලදී. සුමන හා උපුල්වන් දෙදෙන පිළිබඳ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා කරනලද විවේචනාත්මක ග්‍රන්ථ පදනම්කරගෙන විස්තර කරනලදී. සුමන දෙවියා යමදෙවියා වියහැක යන පරණවිතාන මතයේ සිට කතරගම දෙවියාත් සුමනත් දෙදෙනාම එක්කෙනෙකු වියහැකියයි යම පරියාය " ධම්මරාජ " ශබ්දය ගෙන විශේෂ විග්‍රහයක් කරනලදී. ධම්මරාජවරුන් කතරගම විශ්ණුහෙයිනි.

උපුල්වන් හා නාථ දෙදෙනා පුරාණයෙහි එක්කෙනෙකු ලෙස සලකන්ට ඇතැයි යන මතයට අපටද බැසගන්ට සිදුවිය. අවලොකිතෙශ්වරනාථ යන මහායානික බෝධිසත්ත්වයා " නාථ " යන කෙටි නමකින් හඳුන්වමින් ඔහු දෙවියෙකුගේ තත්වයට පත් කෙමෙන් අනුවයට ගියබැව්ද මෙහිදී දක්වා ඇත.

සතරවන පරිච්ඡේදයෙන් රුහුණේ ප්‍රාදේශිය දෙවිවරුන් කිහිප දෙනෙකුම හඳුන්වා දී ඇත. මෙයින් වැලිගම කුමාරපාල මුල්තැනගනී. කුමාරයා සිව්වන අග්බෝ වියහැකියයි පෙන්වාදෙමින් මේ ප්‍රතිමාව "නාථ " ගේය යන්න තහවුරුකරඇත. සමන්කූට යන වදන් ලෝ හඩිගත් මතය පෙන්වා ඇතත් එය ප්‍රතික්ෂේප කරනලදී. අවලොකිතෙශ්වරනාථ බටහිරට අධිපතිබැවින් රුහුණු වැසියන් ඔහුට බස්නාහිර දෙවියෝ යයි අමතන්නට ඇතැයි නව මතයක්ද ඉදිරිපත්කරනලදී. මේ බස්නාහිර දෙවියන් පසුකලෙක රුහුණේ කඳුකරයේ ඇදහූ " රජ්ජුරු බණ්ඩාර " දෙවියන් බවට පරිවර්තනය වන්නට ඇතැයිද සිතමු.

රජ්ජුරුබණ්ඩාර ගැනද අලුතට තොරතුරු මේ පරිච්ඡේදයෙහි අන්තර්ගතව ඇත. " සාමුද්‍රුරුවත්තෙ මඩුව "නමැති දේව ගෙයිලයද අප්‍රකටවූවකි.

පරිච්ඡේදය අවසන්වී ඇත්තේ " වේරගොඩ දෙවියෝ " ගොංගොත් " සිඩ දෙවොල් දෙවියෝ " යන විස්තරයෙනි. දකුණුපලාතේ තීරිය දිග මුහුදු වෙරළට පුරුව මේ දෙවියාගේ බලපෑම් වෙයි.

පස්වන පරිච්ඡේදය රුහුණේ යක්ෂයන් හා යක්තොවිල් පිළිබඳ විස්තරයෙන් යුක්තය. දහඅට පාලිය, රටයකුම , සූනියම , මහසෝන් සමයම සහ සන්නියකුම යන තොවිල්ද දේව තොවිල් පිළිබඳ ඉතා කෙටි විස්තරයක්ද මෙයට ඇතුලත්කර ඇත.

# පටුන

උපකාරානුස්මෘතිය:

සාරාංශය

පළමු පරිච්ඡේදය:

මූලාශ්‍ර

රෝහණ සීමාව.
රුහුණු ජන ජීවිතය.

දෙවෙනි පරිච්ඡේදය:

ලාංකීය මහා යානය.

නිකායාන්තර සංකල්පය.
මහායාන අදහස් රුහුණට බලපෑ අයුරු.

මහායානික බ පෑමේ විශේෂ අවස්ථාව ලෙස දැක්විය හැකි බෝධි

සත්ව වන්දනාවයි.

තෙවෙනි පරිච්ඡේදය:

රුහුණෙහි ප්‍රධාන දෙවිවරු.

1. සමන්,
2. උපුල්වන්.
3. කතරගම
4. නාථ.
5. කිරි අම්මා පිදීම.
6. විෂ්ණු.

සිව්වන පරිච්ඡේදය:

කුඹ රජගල
බස්නාහිර දෙවියෝ.

ශාඩුලුරුවනිගේ වඩුව,
උත්පලවර්ණ බස්නාහිර දෙවියා විද?.
සිද්ධ දෙවොලේ දෙවියො

පස්වැනි පරිච්ඡේදය:

රුහුණෙහි යක්ෂයන් පිළිබඳ විශ්වාසය.
කොවිල්

1. මහසොන් සමයම.
2. රට යකුම.
3. සන්නියම.
4. දේව කොවිල්.